SLGURU.LK

ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ...

## ගම්පහ අධ්‍යාපන කලාපය
## Gampaha Education Zone

### දෙවන වාර ඇගයීම - 2025
### Second Term Evaluation - 2025

| | | |
|---|---|---|
| ශ්‍රේණිය Grade: 12 | විෂයය Subject: දේශපාලන විද්‍යාව I [23] | කාලය Time: පැය 02 |

නම : ..................................................................................................................................................

උපදෙස් :

★ මෙම ප්‍රශ්න පත්‍රය A හා B වශයෙන් කොටස් දෙකකින් සමන්විතය.
★ A කොටස බහුවරණ ප්‍රශ්න 30කින් හා B කොටස කෙටි ප්‍රශ්න 20කින් යුක්ත වේ.
★ සියලුම ප්‍රශ්න වලට පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේ ම සැපයිය යුතුයි.
★ එක් පිළිතුරකට ලකුණු දෙක බැගින් ලකුණු 100 කි.

අංක 1 සිට 20 තෙක් ඇති ප්‍රශ්නවලට නිවැරදි හෝ වඩාත් ගැලපෙන පිළිතුර තෝරන්න.

01. දේශපාලන විද්‍යාව,

1. දේශපාලනය ප්‍රායෝගිකව හැදෑරීම මින් අදහස් වේ.
2. රාජ්‍ය රාජ්‍ය පරිපාලනය හා සමාර භාවිතයක් වේ.
3. ග්‍රීක , චීන සහ ඇමරිකානු චින්තකයින් විෂය හැදෑරීමේ සමාරම්භකයන් ය.
4. දේශපාලන ප්‍රපංචයක් විද්‍යාත්මකව අධ්‍යනය කිරීමකි.
5. ඥානය ගොඩ නැගීමේ එකම මාවත වේ. (.............)

02. දේශපාලනය යනු,

1. ආණ්ඩු ක්ෂේත්‍රයට සීමා වූ බලතරඟයකි.
2. ජාත්‍යාන්තර පද්ධතිය තුල රාජ්‍ය වල හැසිරීම විස්තර කරන සංකල්පයකි.
3. රාජ්‍ය එහි ආයතන සහ සමාජය අතර අන්තර් ක්‍රියාකාරකම් සිදුවන ක්ෂේත්‍රයයි.
4. සාමාජීය විද්‍යාවන්ට මෑත කාලයේ එක් වූ සංකල්පයකි.
5. සියලු දෙනා පිළිගන්නා පරිදි සමාජයේ පොදු යහපත සමඟ බැඳී ඇති ක්‍රියාවලියකි. (.............)

03. දේශපාලනය සමාජ භාවිතාවක් යන්නට අදාල වන්නේ,

1. එමගින් වෘත්තීය දේශපාලඥයන් ගම්‍යමාන කරයි.
2. රාජ්‍ය පරිපාලනයට හා ආණ්ඩුකරණයට සම්බන්ධ ක්‍රියාවලියකි.
3. රාජ්‍ය සහ ආණ්ඩුව යන පරිමණ්ඩල වලින් පිටත සිදුවන ක්‍රියාවලියකි.
4. රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදන ක්‍රියාවලියකි.
5. පොදු සමාජයෙන් ඈත්ව සිදුවන ක්‍රියාවලියකි. (.............)

04. දේශපාලන අධ්‍යනයට යොදා ගන්නා විද්‍යාත්මක ප්‍රවේශයට අදාළ වන්නේ,

1. වාස්තවික දැනුම ගොඩ නැගීමේ එකම මාධ්‍ය ඉන්ද්‍රිය ගෝචර අත්දැකීම් බව අවධාරණය කරයි.
2. ග්‍රීක යුගයේ සිට භාවිතයට ගැනෙන අධ්‍යන ක්‍රමයයි.
3. සමාජීය විද්‍යා අතර ප්‍රථමයෙන් ම භාවිතයට ගැනුනේ දේශපාලන විද්‍යා අධ්‍යනයයි.
4. දේශපාලන ක්‍රමය සංවිධානය කර ගැනීමේ පරමාදර්ශී මාදිලි යෝජනා කරයි.
5. පවතින දේශපාලන සංස්ථා වල යහපත් අයහපත් බව විශ්වාස කරයි. (.............)



SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

05. දේශපාලන අර්ථ ශාස්ත්‍රීය ප්‍රවේශය,

1. දේශපාලනය හැදෑරීම සඳහා මුලින්ම යොදා ගනු ලැබුවේ ඇමරිකානු දේශපාලන විද්‍යාඥයින් ය.
2. මාක්ස්වාදය සමඟ සෘජු සම්බන්ධතාවයක් නොමැත.
3. දේශපාලනය ආර්ථික ක්ෂේත්‍රයෙන් ස්වාධීනව පවතින බව පිළිගනී.
4. චර්යාවාදී අධ්‍යන ක්‍රමය සමඟ සම්පූර්ණයෙන්ම අනන්‍ය වී ඇත.
5. දේශපාලන හා ආර්ථික සමාජීය පන්ති යන සාධක වලින් තීරණය කරන බව පිළිගනී. (.............)

06. ෆ්‍රෑන්ක්ෆර්ට් ගුරුකුලය විසින් පර්යේෂණ කරන ලද්දේ,

1. දේශපාලන විද්‍යාවට සම්බන්ධ කරුණු පමණි.
2. 19 වන සියවසේ මැදභාගයේ පර්යේෂකයින් වේ.
3. ඔගස්ති කොම්ත්, මාක්ස් හා මැක්ස් වෙබ'ර් මෙම ගුරු කුලයට අයත් ය.
4. මොවුන්ගේ අධ්‍යනයන් දේශපාලන විද්‍යාවටත් සමාජ විද්‍යාවටත් වැදගත් වේ.
5. සමාජ විද්‍යාව හා දේශපාලන විද්‍යාව සමීප සම්බන්දතාවයක් නොදක්වන බව පෙන්වා දෙයි. (.............)

07. ''තම රටේ දේශපාලනය මැනවින් අවබෝධ කර ගැනීමට නම් අනෙක් රටවල දේශපාලනය ගැන අවබෝධය ලබා ගැනීමට සිදුවේ.'' යන්න ප්‍රකාශ කළේ,

1. ප්ලේටෝ ඇරිස්ටෝටල් ය.
2. ග්‍රේබ්‍රියල් ඒ ආමන්ඩ් ජෙම්ස් එස් කෝල්මන්
3. සැමුවෙල් පී. හන්ටින්ටන් සහ ජේම්ස් එස් කෝල්මන්
4. ග්‍රේබියල් ආමන්ඩ් , සිඩ්නි වර්බා
5. කෙනත් නිවුමන් සහ ජාන් වැන්ඩන් (.............)

08. රාජ්‍ය හා ආණ්ඩුව සම්බන්ධයෙන් වඩාත් නිවැරදි වන්නේ,

1. බොහෝ දේශපාලන ආයතන උපත ලබන්නේ රාජ්‍ය හා ආණ්ඩුව වෙතිනි.
2. ආණ්ඩුව ස්වාමියා වන අතර රාජ්‍ය සේවකයා වේ.
3. රාජ්‍ය සහ ආණ්ඩුව, ස්ථාවර දේශපාලන ආයතන වේ.
4. රාජ්‍ය හා ආයතන අනන්‍ය සම වේ.
5. රාජ්‍ය හා ආණ්ඩුව එකිනෙකින් වෙන් වන්නේ 16 වන සියවසේ දී පමණ ය. (.............)

09. සිවිල් සමාජය සම්බන්ධයෙන් නොගැලපෙන ප්‍රකාශය වන්නේ,

1. රාජ්‍යයෙන් පරිභාහිරව ස්වාධීන පුරවැසියන් පොදු අරමුණු වෙනුවෙන් එකට එකතු වූ අවකාශය යි.
2. සමාජ අවකාශය තුල ක්‍රියාකරන පුරවැසි සංවිධාන ද සිවිල් සමාජය වේ.
3. දේශපාලන පක්ෂ වලට මෙන් ක්‍රමානුකූල සංවිධාන ව්‍යුහ හා සාමාජිතාවයක් නොවේ.
4. සක්‍රිය සිවිල් සමාජයක් පැවතීම ශක්තිමක් ප්‍රජාතන්ත්‍රවාදී ලක්ෂණයක් නොවේ.
5. පුළුල් බහුජන කොටස් සෘජු දේශපාලන ක්‍රියාකාරීත්වයට යොමු කිරීම විශේෂත්වයකි. (.............)

10. දේශපාලන දර්ශනයට අදාල නොවන්නේ,

1. ප්ලේටෝ, ඇරිස්ටෝටල් දේශපාලන විද්‍යාවට අදාළ බොහෝ කරුණු ගොඩ නගා ඇත්තේ දාර්ශනික කරුණු පදනමින් ය.
2. මගින් කිසියම් සංසිද්ධියක් පිළිබඳව තත්වානුරූපීව මනසින් දකී.
3. නිශ්චිත න්‍යාය හෝ සිද්ධාන්ත දේශපාලන දර්ශනයෙහි දක්නට නොලැබේ.
4. ප්ලේටෝගේ මනෝරාජ, කාල්මාක්ස්ගේ කොමියුනිෂ්ට් යුගය නිදසුන් වේ. (.............)
5. පවත්නා තත්ත්වයට වඩා පැවතිය යුතු තත්ත්වය දක්වයි.



SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

11. දේශපාලන න්‍යාය,

    1. ආණ්ඩුක්‍රම තුළ සැබවින්ම පවත්නා න්‍යායන් හා සිද්ධාන්තයන් අධ්‍යනය කරයි.
    2. තුන් ආකාරයකට වර්ග වේ.
    3. සෑම කල්හි පොදු මානව වර්ගයාම පිළිගත හැකි සිද්ධාන්තයකි.
    4. කාලය අනුව දාර්ශනිකයා අනුව වෙනස් නොවේ.
    5. ප්‍රතිමානීයව ගොඩනැගේ. (.............)

12. දේශපාලන ආයතන,

    1. ද්වි ප්‍රභේදිත වේ.
    2. විධිමත්ව ගොඩ නැගේ.
    3. පවුල විධිමත් ආයතනයකි.
    4. සෑම ආයතනයක්ම පොදු ජන නියෝජනය සපයයි.
    5. නූතන දේශපාලන ආයතන වගකීමෙන් අඩුය. (.............)

13. තුලනාත්මක දේශපාලනය,

    1. 1930 දේශපාලන විද්‍යාවේදී නිශ්චිත ධාරාවක් විය.
    2. බ්‍රිතාන්‍ය තුළ ආරම්භ වීය.
    3. දෙවන ලෝක යුධසමයෙන් පසුව වර්ධනය විය.
    4. ජාතික දේශපාලනය මෙමගින් ගම්‍යමාන වේ.
    5. එක් රටක දේශපාලන ක්‍රියාදාමය අධ්‍යනය කිරීම අර්ථ දැක්වේ. (.............)

14. නූතන රාජ්‍ය භූමිකාව,

    1. ව්‍යවස්ථාදායක කාර්යයන්ට සීමා වේ.
    2. විධායක හා අධිකරණ කාර්යයන් සිදු කිරීම.
    3. ආර්ථික පරිපාලනය සහ මෙහෙය වීම.
    4. සදාචාරාත්මක පුරවැසියෙකු බිහි කිරීම.
    5. බලය සම්බන්ධ දැනුම ලබා දීම. (.............)

15. ''දේශපාලනය වෘත්තියක් වශයෙන්'' කෘතිය රචනා කරන ලද්දේ,

    1. මයිකල් සැන්ඩල්
    2. මැක්ස් වෙබර්
    3. යර්ගන් හබර්මාස්
    4. ජෝන් රෝල්ස්
    5. මිෂෙල් ෆුකො (.............)

16. නූතන ජාතික රාජ්‍ය,

    1. පූර්ව නූතන රාජ්‍යවල සම්භවය විය.
    2. දේශපාලන බලය විමධ්‍යගතකොට පවතී.
    3. වර්තමානයේ බහුත්වවාදය පිළිගනී.
    4. ''එක් රාජ්‍යයකට රක් ජනවර්ගයක්'' යන පිළිගැනීම මත පදනම් විය.
    5. වර්ධනය වූයේ 17 වන සියවසේ දීය. (.............)


SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

17. ගෝලීයකරණය හා රාජ්‍ය,

1. සංවර්ධනය වෙමින් පවත්නා රාජ්‍ය ස්වාධීන කරයි.
2. ගෝලීය ධනවාදීන් විසින් නොදියුණු ජතීන්ගේ දියුණුව වෙන්වෙන්ම කැප වේ.
3. ලෝකය පුරා පවත්නා ජාතික රාජ්‍ය ලක්ෂණ වල බණ්ඩනයක් සිදු වී ඇත.
4. බහු ජාතික සමාගම් වල බලය පිරිහෙමින් පවතී.
5. සෑම දාර්ශනිකයන්ම ජාතික රාජ්‍ය අවසානයට ලක්වන බව පෙන්වා දෙයි. (.............)

18. ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍ය,

1. වැඩවසම් රාජ්‍ය හා පරමාධිකාරි ආණ්ඩුවට සමපාත විය.
2. ලිබරල්වාදය හා ප්‍රජාතන්ත්‍රවාදය විභේදනය වී ගොඩ නැගුණි.
3. සීමිත ආණ්ඩුව සංකල්පය මූලික සංකල්පයකි.
4. නිර්බාධවාදී රාජ්‍ය ක්‍රමය ලෙස ද හඳුන්වයි.
5. පාලක හා පාලිත දෙපක්ෂයට අසමාන නෛතික පද්ධති පවතී. (.............)

19. ස්වාධිපත්‍ය,

1. ආණ්ඩුව සතු උත්තරීතර බලයයි.
2. වෙනත් රාජ්‍යයන්ට බලපෑම් කිරීමට ඇති හැකියාව භාහිර ස්වාධිපත්‍යයි.
3. සන්ධීයවාද හා ගෝලීයකරණය මගින් තවත් ශක්තිමත් වී ඇත.
4. අධිපති රාජ්‍යන් හේතුවෙන් දුබල රාජ්‍ය ස්වාධිපත්‍ය දුර්වල වී ඇත.
5. පළමුවරට භාවිතා කරනු ලැබුවේ ජීන් නොසික් විසිනි. (.............)

20. පුරවැසියා,

1. රාජ්‍යක ජීවත් වන සියලු දෙනා පුරවැසියන් වේ.
2. පුරවැසිභාවය හිමිකර දීමටත් අහිමිකිරීමටත් හැකි එකම ආයතනය රාජ්‍යයි.
3. රාජ්‍යට අවනත වීම අත්‍යවශ්‍ය නොවේ.
4. බලය, නායකත්වය, වයස යන සාධක මත පුරවැසිභාවය හිමිවේ.
5. රූසෝගේ පොදු කැමැත්ත මගින් ''සමාජ පුරවැසිභාවය'' යන සංකල්පය හඳුන්වා දී ඇත. (.............)

අංක 21 සිට 25 තෙක් ප්‍රශ්න වලට දී ඇති ප්‍රකාශ අතුරින් නිවැරදි ප්‍රකාශ කාණ්ඩය ඇතුලත් වරණය තෝරා එහි අංකය වරහන් තුළ ඇති තිත් ඉර මත ලියන්න.

21. චර්යාවාදයේ මෑතකාලීන ප්‍රවණතා

1. A පුරවැසි දේශපාලන සහභාගීත්වය ප්‍රමුඛ අධ්‍යන ප්‍රපංචයකි.
2. B දේශපාලන විද්‍යා විෂය පථය පෘථුල වීම.
3. C 20 වන සියවසේ අගභාගයේ දී පසුබෑමට ලක්වේ.
4. D දේශපාලන සංකල්පය පිළිබඳ අධ්‍යන නොකිරීම.
5. E 1950-60 දශකවල අධිපති ධාරාවක් බවට පත්වීම.

1. ABCD   2. ABDE   3. ACDE   4. BCDE   5. ABCE   (.............)

22. දේශපාලන මතවාද,

1. A සමාජයේ විශාල ජන කොටසක් ආකර්ෂණය කරගැනීමට සමත් වේ.
2. B එකිනෙකට අසංගත අදහස් මාලාවකින් යුක්ත වේ.
3. C සමාජයේ දේශපාලන විඥානය, විස්වාස හා ඉදිරි දැක්ම හැඩගැස්වීමට සමත් ය.
4. D සමාජ දේශපාලනයට බලපෑම් කිරීමට සමත් ය.
5. E දේශපාලන මතිමතාන්තර පද්ධතියකින් සමන්විත ය.

1. ABCD   2. BCDE   3. ABDE   4. ACDE   5. ABCE   (.............)



SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

23. සමාජවාදය,

1. A රදළ වැඩසම්වාදයට එරෙහිව ගොඩ නැගුණි.
2. B 19 වැනි සියවසේ දෙවන භාගයේ ආරම්භ විය.
3. C ඓතිහාසික භෞතිකවාදය මගින් ප්‍රධාන ප්‍රවාදය ඉදිරිපත් කරනු ලැබීය.
4. D 20 වන සියවසේ අතිමූලික ධාරාවක් බවට පත් විය.
5. E සමාජ සමානාත්මතාවය, දේපළ වල පොදු සමාජ අයිතිය ඇති කිරීම මූලික විය.

1. ABCD 2. BCDE 3. ABDE 4. ACDE 5. ABCE (.............)

24. රාජාණ්ඩු,

1. A පූර්වනූතන මාදිලියකි.
2. B රජුට ලැබෙනුයේ සාම්ප්‍රදායෙනි.
3. C ඒකීය පුරවැසිභාවය හිමිවීම.
4. D සාමාන්‍ය ජනයාට අයිතිවාසිකම් හිමිවිය.
5. E සියලු බලතල රජු වෙත කේන්ද්‍රගත විය.

1. ABCD 2. BCDE 3. ABDE 4. ACDE 5. ABCE (.............)

25. යටත් විජිත රාජ්‍ය,

1. A යුරෝපීය බලවේග විසින් මෙහෙයවීය.
2. B පූර්ව යටත් විජිතයන්හි වැඩවසම් රාජාණ්ඩු හෝ ගෝත්‍ර ක්‍රියාත්මක විය.
3. C ප්‍රතිෂ්ඨාපනය වීමෙන් දේශපාලන සමාජ ආර්ථික පරිවර්තනයන් සිදු විය.
4. D භෞමික වශයෙන් පූර්ව යටත් විජිතයට සමාන විය.
5. E යුද්ධ ක්‍රියාමාර්ග මගින් ද පිහිටුවනු ලැබීය.

1. ABCD 2. BCDE 3. ABDE 4. ACDE 5. ABCE (.............)

අංක 26 සිට 30 තෙක් ඇති ප්‍රශ්න සඳහා ප්‍රකාශ දෙක බැගින් දක්වා ඇත. එක් එක් ප්‍රශ්නය හා සම්බන්ධව දක්වා ඇති ප්‍රකාශ යුගලයට වඩාත් ගැලපෙන්නේ පහත වගුවේ දැක්වෙන (1) , (2) , (3) , (4) හා (5) යන වරණවලින් කවර වරණය දැයි තෝරා එහි අංකය වරහන් තුල ඇති තිත් ඉරමත ලියන්න.

| අංකය | පළමු ප්‍රකාශය | දෙවන ප්‍රකාශය |
|---|---|---|
| 1 | සත්‍ය | සත්‍ය |
| 2 | සත්‍ය | අසත්‍ය |
| 3 | අසත්‍ය | සත්‍ය |
| 4 | අසත්‍ය | අසත්‍ය |
| 5 | සත්‍ය | සත්‍ය වන අතර පළමු ප්‍රකාශය තව දුරටත් විස්තර වේ. |



SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

| | පළමු ප්‍රකාශය | දෙවන ප්‍රකාශය |
|---|---|---|
| 26 | යටත් විජිත රාජ්‍ය මාදිලිය විශේෂ රාජ්‍ය මාදිලියක් ලෙස න්‍යායික තර්කයක් ලෙස ගොඩ නැගුවේ පාකිස්ථානු සම්භවයක් සහිත හම්සා අලාම් විසිනි. | අධිපත්‍යට පුද්ගලයා සාකල්‍යයෙන්ම අවනත වීම මෙන්ම පුද්ගල විමුක්තිය ඇති කිරීම ෆැසිස්ට් රාජ්‍යයක මූලික ලක්ෂණයකි. |
| 27 | සමාජවාදී රාජ්‍යයක දේශපාලන පක්ෂ ක්‍රමයක් පවතී. | සමාජවාදී රාජ්‍යයක පුරවැසියාගේ භෞතික ජීවන තත්වය වර්ධනය කිරීමට අවශ්‍ය සාධක සමාන අවකාශ සහිතව සැපයීම මූලික වගකීමක් වේ. |
| 28 | වෙළෙඳපොල ආර්ථිකයට ඉඩ දෙනු වස් ජාතික ආර්ථිකය විවෘත කිරීමට සමකාලීන රාජ්‍යයන් පියවර ගත යුතුය. | නව ලිබරල්වාදයට අනුව ගොඩ නැගුණු ජගත් ආර්ථිකය හසුරවනු ලබන්නේ ලෝක බැංකුව, අන්තර් ජාතික මූල්‍ය අරමුදල, බහුජාතික සමාගම් වැනි අන්තර්ජාතික සංවිධාන විසිනි. |
| 29 | වර්තමාන ලෝකයේ පොදු ප්‍රතිපත්ති ජාතික මට්ටමේ ස්වාධිපත්‍ය ඒකක මගින් තීන්දු කරනවාට වඩා ප්‍රබලව උප ජාතික සංවිධාන වලින් තීරණය වේ. | රාජ්‍ය සම්බන්ධයෙන් විශේෂ ස්ත්‍රීවාදී ................. ගොඩ නගා ඇත. |
| 30 | මාක්ස්වාදී ස්ත්‍රීවාදයට අනුව ස්ත්‍රී විමුක්තිය සඳහා රාජ්‍ය මැදිහත් වීම අනුමත කරති. | සමාජ පුරවැසිභාවය T.H. මාෂල් විසින් ඉදිරිපත් කල සංකල්පයකි. |

## B කොටස

31. දේශපාලනය යන්න ප්‍රධාන අර්ථ දෙකකින් තේරුම් ගනී. ඒවා ලියන්න.

..........................................................................................

..........................................................................................

32. ග්‍රීක පෙදුර රාජ්‍යට සම්බන්ධ විෂය කාරණා පුළුල් පරාසයක පැතිර ගිය තේමා වේ. ඒවායින් දෙකක් ලියන්න.

..........................................................................................

..........................................................................................

33.(i) ආර්ථික ක්‍රියාකාරකම් සම්පූර්ණයෙන්ම රාජ්‍ය විසින් මෙහෙය විය යුතුය.
(ii) නියෝජනය සැපයීම ප්‍රධාන අරමුණු කරගෙන බිහිවී ඇති ආයතනය

ඉහත ප්‍රකාශයෙන් කියවෙන ඒවා ලියන්න.

(i)..........................................................................................

(ii)..........................................................................................

34. ඡන්දය ලබා දීම මගින් පුරවැසියකු වගකීම් දෙක් ඉටු කරයි. ඒවා නම් කරන්න.

1. ..........................................................................................
2. ..........................................................................................

35. තුලනාත්ම අධ්‍යනයේ ප්‍රධාන ධාරා දෙකක් ලියන්න.

1. ..........................................................................................
2. ..........................................................................................

36. අර්ථ ශාස්ත්‍රිය ප්‍රවේශයේ මුල්කාලීන දාර්ශනිකයන් දෙදෙනෙකු සඳහන් කරන්න.

1. ..........................................................................................
2. ..........................................................................................

SLGURU.LK

For Educational Purpose Only

SLGURU.LK

37. 20 වන සියවසට පෙර සිටි සමාජ විද්‍යා විධික්‍රමයේ පුරෝගාමියෙකු හා 20 වන සියවසේ මැද භාගයේ සමාජ විද්‍යා පර්යේෂණ කළ ගුරුකුලය නම් කරන්න.

1. ................................................................................................

2. ................................................................................................

38. රාජ්‍ය වෙනුවෙන් ආණ්ඩුව ඉටුකරන ප්‍රධාන කාර්යයන් දෙකක් ලියන්න.

1. ................................................................................................

2. ................................................................................................

39. නූතන ජාතික රාජ්‍යයේ ලක්ෂණ දෙකක් ලියන්න.

1. ................................................................................................

2. ................................................................................................

40. මණ්ඩලාකාර රාජ්‍ය ක්‍රමය පිළිබඳ අදහස් දැක්වූ දාර්ශනිකයා සහ මෙම විග්‍රහය සඳහා මූලික කරගත් සමාජය කුමක්ද?

1. ................................................................................................

2. ................................................................................................

41. මධ්‍යගත පරමාධිපත්‍යයේ ද්‍රව්‍යමය සාධක දෙකක් ලියන්න.

1. ................................................................................................

2. ................................................................................................

42. පහත කෘති රචනා කළ දාර්ශනිකයින් ලියන්න.

1. ජාතික රාජ්‍යයේ අවසානය
2. ප්‍රජාතන්ත්‍රවාදය, ජාතික රාජ්‍ය හා ගෝලීය ක්‍රමය

1. ................................................................................................

2. ................................................................................................

43. ජාතික රාජ්‍යයේ ස්වායත්තතාව වෙනස් වීම ආකාර දෙකකින් සිදුවී ඇති බව ඩේවිඩ් හෙල්ඩ් පෙන්වා දෙයි එම ආකාර දෙක ලියන්න.

1. ................................................................................................

2. ................................................................................................

44. පුරවැසිභාවය සම්බන්ධයෙන් න්‍යායාත්මක මතවාද ඉදිරිපත් කළ මහාචාර්යවරයා හා ඒ සම්බන්ධ ඔහුගේ රචනය ලියන්න.

1. ................................................................................................

2. ................................................................................................

45. සිවිල් පුරවැසිභාවය යටතේ ලැබෙන අයිතිවාසිකම් දෙකක් ලියන්න.

1. ................................................................................................

2. ................................................................................................

46. ග්‍රීක නාගරික රාජ්‍යට අනන්‍ය වූ අදහස් දෙකක් පවතී. ඒවා ලියන්න.

1. ................................................................................................

2. ................................................................................................

47. 1. සිවිල් සමාජය සාංගමික ප්‍රජාතන්ත්‍රවාදයේ අවකාශයක් ලෙස හඳුන්වා දුන්නේ කවුරුන් ද?

................................................................................................

2. සිවිල් සමාජය රාජ්‍ය හා පුරවැසියන් අතර පවතින සමාජ සංස්කෘතික අවකාශයක් ලෙස නිර්වචනය කරනු ලැබුවේ කවුරුන් ද?

................................................................................................

SLGURU.LK

For Educational Purpose Only

SLGURU.LK

48. කෝල්බෲක් කැමරන් යෝජනා දෙකක් ලියන්න.

1. ........................................................................................................................................................................

2. ........................................................................................................................................................................

49. 1910 කෲව් මැකලන් ආණ්ඩු ක්‍රමය හා 1930 ඩොනමෝර් ආණ්ඩුක්‍රමය මගින් හඳුන්වා දෙනු ලැබූ ඡන්ද බලය ද්විත්ව ස්වරූපයක් ගනී. ඒවා නම් කරන්න.

1. ........................................................................................................................................................................

2. ........................................................................................................................................................................

50. සමකාලීන තුලනාත්මක දේශපාලන විද්‍යා අධ්‍යයනය තුල දැකිය හැකි ප්‍රධාන ලක්ෂණ දෙකක් ලියන්න.

1. ........................................................................................................................................................................

2. ........................................................................................................................................................................

SLGURU.LK

For Educational Purpose Only

“The beautiful thing about learning is that nobody can take it away from you.” — B.B. King

Visit SLGURU.LK to download papers and notes.

SLGURU.LK

ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය

**ගම්පහ අධ්‍යාපන කලාපය**
**Gampaha Education Zone**

**දෙවන වාර ඇගයීම - 2025**
**Second Term Evaluation - 2025**

| | | |
|---|---|---|
| ශ්‍රේණිය Grade: 12 | විෂයය Subject: දේශපාලන විද්‍යාව II [23] | කාලය Time: පැය 02 |

නම : ..........................................................................

උපදෙස් :

★ I කොටසින් අවම වශයෙන් එක් ප්‍රශ්නයක් ද,
★ II කොටසින් අවම වශයෙන් ප්‍රශ්න දෙකක් ද,
★ III කොටසින් අවම වශයෙන් එක් ප්‍රශ්නයක් ද, වන සේ ප්‍රශ්න පහකට පිළිතුරු ලියන්න.

## I කොටස

1. දේශපාලනය හැදෑරීමේ දාර්ශනික ප්‍රතිමානීය ප්‍රවේශය පිළිබඳ විස්තර කරන්න. (ල. 20)
2. දේශපාලන න්‍යාය යනු කුමක්දැයි විස්තර කර දේශපාලන අධ්‍යනය කිරීමේදී න්‍යාය වැදගත් වන්නේ මන්දැයි සාකච්ඡා කරන්න. (ල. 20)
3. පහත සඳහන් ඒවා විස්තර කරන්න. (ල. 10)
   (i) දේශපාලන පක්ෂ
   (ii) තුලනාත්මක දේශපාලනය

## II කොටස

4. ලංකාවේ බ්‍රිතාන්‍ය යටත් විජිත යුගයේ ඇති කළ දේශපාලන පරිවර්ථනයන් සාකච්ඡා කරන්න. (ල. 20)
5. ''කෝල්බෲක් කැමරන් ප්‍රතිසංස්කරණය මගින් ඇතිකළ යෝජනා හරහා ලාංකික සමාජය ආර්ථික හා සමාජීය වශයෙන් පරිවර්ථනය විය'' විග්‍රහ කරන්න. (ල. 20)
6. ගෝලීයකරණය හේතුවෙන් ජාතික රාජ්‍යයන්හි සිදු වූ නව ප්‍රවණතාවයන් සාකච්ඡා කරන්න. (ල. 20)
7. (i) ග්‍රෝත්‍රික රාජ්‍ය ක්‍රමය හඳුන්වන්න. (ල. 05)
   (ii) නූතන ජාතික රාජ්‍ය පිළිබඳ සාකච්ඡා කරන්න. (ල. 15)

## III කොටස

8. ''පාලන තන්ත්‍රය'' යනු කුමක්දැයි විස්තර කරන්න. (ල. 20)
9. පහත ඒවා සාකච්ඡා කරන්න.
   (i) ''රාජ්‍ය හා පුරවැසියා'' (ල. 10)
   (ii) ''රාජ්‍ය හා ස්වාධිපත්‍ය'' (ල. 10)
10. සිවිල් සමාජය පිළිබඳ සාකච්ඡා කරන්න. (ල. 20)



SLGURU.LK
For Educational Purpose Only

“The beautiful thing about learning is that nobody can take it away from you.” — B.B. King

Visit SLGURU.LK to download papers and notes.